යටිනුවර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 30 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබූ ඉඩම් කැබලි 32 ක වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.
(ආ) සභාවට අයිතිය පවරා ගෙන නොතිබූ රු.8,369,000 ක් වටිනා මෝටර් රථ 04 ක් පිළිබඳ ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.
(ඇ) සභාව සතු කැබ් රථයක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.
(ඈ) සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගත නොවූ කර්මාන්ත 26 ක රු.10,700,000 ක් වූ ඇස්තමේන්තුගත වටිනාකමක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.
(ඉ) රු.61,249 ක් වටිනා කසළ කරත්ත 02 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.
(ඊ) රු.56,776 ක් වටිනා ලේසර් ප්‍රින්ටර් 04 ක් කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.
(උ) සභාවෙන් සපයන ලද ණය මුදල් භාවිතා කර, සේවකයින් පෞද්ගලිකව මිල දී ගෙන තිබූ රු.8,510 ක් වටිනා පාපැදි 13 ක් මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.
(ඌ) සභාව සතු සියඹලාගොඩ සත්ත්ව ගොවි පොළෙහි ගවයින් 05 ක හා එළුවන් 02 කගේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.
**(එ) 2017 ජූලි 12 දිනැති මූ.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව අනුව, ට්‍රැක්ටරයකට හා ට්‍රේලරයකට සිදු වූ රු.1,061,065 ක පාඩුව හා ඒ වෙනුවෙන් රක්ෂණයෙන් ලබා දීමට එකඟ වී තිබුණු රු.700,000 ක රක්ෂණ වන්දි මුදල ගිණුම්ගත කර නොතිබුණි.**

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
---------------------

**පුස්තකාල පොත් ගිණුම අනුව ශේෂය රු.5,293,682 ක් වුවත්, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එම ශේෂය රු.5,300,733 ක් වූයෙන්, රු.7,051 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.**

**1.3.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතු වටිනාකම රු.80,763,558 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,396,903 ක් විය. අවුරුදු 01 ත් 05 ත් අතර කාලයට අදාළ හිඟ ගිණුම් ශේෂයන් හි එකතුව රු.31,845,892 ක් වූ අතර, 2018 අප්‍රේල් 26 දිනට රු.78,736,012 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.44,346,886 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකමින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,471,471 ක් විය. අවුරුදු 01 ත් 05 ත් අතර කාලයට අදාළ හිඟ ගිණුම් ශේෂයන් හි එකතුව රු.5,531,370 ක් වූ අතර, 2018 ජූනි 21 දිනට රු.43,144,881 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි.

**1.3.4** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.21,237,687 ක් වූ ගිණුම් විෂයන් 05 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5** අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය | -- | සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව වෙත අනවසර ඉදිකිරීම් 48 ක් වාර්තා වී තිබූ අතර, ඉන් 41 ක් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | 3,647,214 | 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 120 කදී ලැබී තිබූ කර්මාන්ත අත රැඳවුම් තැන්පත් ගිණුමේ තවදුරටත් රඳවා ගෙන තිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | -- | සභාව සතු වාහන 02 ක ඉන්ධන දහනය අවුරුදු 02 කට වඩා වැඩි කාලයක සිට පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

**ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.42,381,202 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,113,445 ක් විය.**

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,780,560 | 4,833,422 | 5,086,060 | 3,534,914 | 4,092,000 | 5,014,228 | 5,122,277 | 3,937,504 |
| (ii) | කුලී | 240,000 | 87,000 | 87,000 | -- | 220,000 | 107,750 | 107,750 | -- |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,450,000 | 2,268,350 | 2,268,350 | 11,145 | 1,950,500 | 1,948,400 | 1,948,400 | 11,145 |
| (iv) | වෙනත් ආදායම් | 49,758,520 | 40,494,541 | 19,449,172 | 65,549,527 | 36,342,600 | 46,660,533 | 48,446,951 | 44,375,375 |
| | එකතුව | 57,229,080 | 47,683,313 | 26,890,582 | 69,095,586 | 42,605,100 | 53,730,911 | 55.625,378 | 48,324,024 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

**සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.48,324,024 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.69,095,586 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 43 ක් විය.**

### 2.2.3 වරිපනම් හා බදු

**(අ) වර්ෂ 10 කටත් පෙර සිට බිල් කෙරෙමින් එන රජයේ ආයතනවලින් අය විය යුතු රු.872,648 ක වරිපනම් බදු අය කර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.**

**(ආ) පෞද්ගලික දේපළ හිමි වරිපනම් බදු ඒකක 124 කින් අය විය යුතු වරිපනම් බදු රු.583,460 ක් වර්ෂ 02 ත් 12 ත් අතර කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ද නොතිබුණි.**

### 2.2.4 වෙනත් ආදායම්

**2016 හා 2017 වර්ෂවලට අදාළ රු.557,400 ක ත්‍රී රෝද රථ ගාස්තුවක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**2.2.5** උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් **2017** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.**2,096,882** ක් හා මුද්දර ගාස්තු රු.**63,549,527** ක් වූ අතර, මෙම ශේෂයෙන් **2018** ජුනි **20** දින වන විට උසාවි දඩ රු.**69,336** ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

--------------------------

**3.1** කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ **03** වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රතිපාදන වැය නොකිරීම

-----------------------------

සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් යටතේ වියදම් දැරීමේ දී, වැය විෂයන් **02** කට වෙන් කර තිබූ රු.**310,000** ක් අරමුණුගත කාර්යයන් ඉටු කර ගැනීමකින් තොරව මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණු අතර, වැය විෂයයන් **02** කට වෙන් කර තිබූ රු.**1,250,000** කින් රු.**701,690** ක් වැය කිරීමෙන් ප්‍රතිපාදන සියයට **16** සිට සියයට **61** ක් දක්වා අඩු මට්ටමකින් උපයෝජනය කර තිබුණි.

(ආ) ඉටු නොකළ කර්තව්‍යයන්

------------------------------

(i) **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **85**(අ), (ආ) හා (ඇ) හි සඳහන් අරමුණු පිළිබඳ සලකා බැලීමකින් තොරව, පේරාදෙණිය නගරයේ පිහිටි පොදු වැසිකිළිය වර්ෂ ගණනාවක සිට නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා, සෞඛ්‍යයට අහිතකර ලෙස ඉතා අබලන් තත්ත්වයේ පැවතුණි.

(ii) **2016** වර්ෂයේ දී පළාත් පාලන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.**1,000,000** ක ප්‍රතිපාදන පොදු වැසිකිළි නඩත්තුව වෙනුවෙන් ලබා දී තිබුණත්, එකී ප්‍රතිපාදන උපයෝගී කර ගෙන වැසිකිළි නඩත්තු කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන කසළ ටොන් **5** ක් හා කඩුගන්නාව නගර සභාවේ කසළ ටොන් **2.5** ක් කිරිමැටියාව කසළ අංගනයට රැස් කර අර්ධ ස්වායු අගල් ක්‍රමය යටතේ කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) **2018** මැයි **15** දිනදී කරන ලද ස්ථානීය පරීක්ෂාවට අනුව, කිසිදු ක්‍රමවේදයකින් තොරව භූමිය පුරා තැන තැන කසළ දමා තිබූ අතර, කසළ අංගනය පුරා ජලය රැඳී තිබුණි.

(ii) කසළ බැහැර කරනු ලබන ඉඩම ප්‍රාදේශීය සභාව සතු භූමියක් නොවූ අතර, ඉඩමේ නිරවුල් අයිතිය හඳුනා ගෙන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කසළ බැහැර කිරීම සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.

(iii) කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කර ඇතත්, විධිමත් ක්‍රමවේදයකින් හා ප්‍රමාණාත්මකව සිදු නොවන බවක් නිරීක්ෂණය විය.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන්, එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි.

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාළව අවස්ථා 23 කදී ලැබී තිබූ රු.2,038,975 ක ආදායම් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද රු.473,640 ක විවිධ ණයගැති ශේෂයන් හා 2010 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද විශ්‍රාම වැටුප් ණයගැතියන් ලෙස දක්වා තිබූ රු.8,900 ක ශේෂයක් හඳුනා ගෙන අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3** මානව සම්පත් කළමනාකරණය

----------------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර තනතුරු 16 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ හා සේවකයෙකුගෙන් අය වීමට තිබූ රු.322,453 ක සේවක ණය ශේෂයක් මාස 06 ත් වසර 05 ත් අතර කාල පරාසයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4** මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

(අ) ප්‍රාදේශීය සභාව පවත්වා ගෙන ගොස් තිබූ මාර්ග ඉන්වෙන්ට්‍රිය වර්ෂ ගණනාවක සිට යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සතු සියඹලාගොඩ වැඩ ඒකකය අසල ගවයින් 02 ක් හා එළුවන් 07 කගෙන් සමන්විතව කුඩා සත්ත්ව ගොවිපලක් නිශ්චිත අරමුණකින් තොරව පවත්වා ගෙන ගොස් තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 02 ක් 2006 වර්ෂයේ සිට හා තවත් කඩ කාමරයක් 2016 වර්ෂයේ සිට වසා දමා තිබුණි.

(ඈ) වර්ෂ 05 කට වරක් හෝ නව වරිපනම් තක්සේරුවක් ක්‍රියාත්මක කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව 2006 වර්ෂයේ වරිපනම් තක්සේරුව මතම 2017 වර්ෂයේ දීත් වරිපනම් ගාස්තු අය කර තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ දී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රදේශ 05 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනා ගෙන ඇතත්, 2017 වර්ෂය අවසන් වන විටත් එකී ප්‍රදේශවල දේපළ සඳහා වරිපනම් බදු අය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**3.5** වත්කම් කළමනාකරණය

---------------------------

**නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

(අ) රු.575,716 ක් වටිනා GI බට 520 ක් අනාරක්ෂිතව ස්වාභාවික ආපදාවලට ලක් වෙමින් නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(ආ) ධාවනය කළ නොහැකි රු.1,217,500 ක් වටිනා වාහන 04 ක් හා රු.564,000 ක් වටිනා ට්‍රේලර් 04 ක් අපහරණය කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව වර්ෂ 04 කට අධික කාලයක සිට විනාශ වීමට ඉඩ හැර තිබුණි.

(ඇ) ධාවන තත්ත්වයේ පවතින රු.3,365,800 ක් වටිනා වාහන 02 ක් වසරක කාලයකට පෙර සිට ධාවනයට යොදා ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

**3.6** හඳුනාගත් පාඩු

-------------------

ප්‍රාදේශීය සභාව සතු රු.987,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ටේලරයක් 2011 වර්ෂයේ දී අනතුරකට භාජනය වී සම්පූර්ණයෙන් හානියට පත් වී තිබුණි. විනාශ වූ ට්‍රැක්ටර් රථය රක්ෂණ ආයතනයෙන් පවරා ගෙන රු.700,000 ක වන්දි මුදලක් ලබා දීමට එකඟ වී ඇතත්, 2018 මැයි 15 දින වන විටත් එම මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7** ප්‍රසම්පාදනය

-------------

ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂයේ දී රු.58,953,063 ක ප්‍රාග්ධන වියදම් දරා ඇති නමුත්, ඒ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**3.8** අවිධිමත් ගනුදෙනු

--------------------

1995 මාර්තු 15 දිනැති අංක 08/01/38 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛයේ (1) ඡේදය ප්‍රකාරව සැලසුම් කමිටුව රාජකාරී වේලාවෙන් බැහැරව පැවැත්විය යුතු බව දක්වා ඇතත්, සැලසුම් කමිටු රාජකාරී සඳහා සහභාගී වූ බවට සඳහන් කරනු ලබන නිලධාරීන් 05 කගේ එක් එක් දිනයේ පිටවීම සටහන් කර නොතිබීමෙන් රාජකාරී වේලාවෙන් පසුව සැලසුම් කමිටු සඳහා සහභාගී වූ බව සනාථ කර ගැනීමට නොහැකි විය. මේ අනුව, එම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.47,000 ක් දීමනා ගෙවා තිබුණි.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

**4.1** අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 02 ක සියයට 18 සිට සියයට 102 දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 14 සිට සියයට 66 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2** අභ්‍යන්තර විගණනය

-----------------------

**අභ්‍යන්තර විගණන නිලධාරිනියට විවිධ විෂයය රාජකාරී කටයුතු පවරා තිබීම හේතුවෙන්, අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව හා ප්‍රමාණාත්මකව ඉටු කිරීමට නොහැකි වී තිබුණි.**

**5.** පද්ධති හා පාලනය

--------------------

**විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.**

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය නොකිරීම |
| | | ii. | දියුණු කළ ප්‍රදේශවලින් වරිපනම් බදු අය කර නොගැනීම |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. | ලේඛන අවිධිමත්ව පවත්වා ගෙන යාම |
| | | ii. | ආරක්ෂාව තහවුරු නොකිරීම |
| | | iii. | අයිතිය තහවුරු කර නොගැනීම |
| (ඇ) | ණයගැතියන් හා ණයහිමියෝ | i. | ගිවිසුම්ගත නොවූ කර්මාන්ත ණයහිමි කිරීම |
| | | ii. | පැරණි ණයගැති ශේෂ අය කර ගැනීමට කටයුතු නොකිරීම |
| | | iii. | පැරණි කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) | අයවැය පාලනය | | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වැය නොකිරීම |